# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
011 286 4051


03

මගේ අංකය / எனது இல / My No. L2/1/50/චක්‍රලේඛ/2019-01

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2019.09. 18

චක්‍රලේඛ අංක - 2019/2

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
ඉඩම් කොමසාරිස්වරු/ නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන්(අන්තර් පළාත්)
සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් වෙත

**<u>දීර්ඝකාලීන බදු ලබා දී ඇති රජයේ ඉඩම් සහ එම ඉඩම් වල පිහිටි ගොඩනැගිලි අතුරු බදු ලබා දීම.</u>**

වර්තමානයේදී දීර්ඝකාලීන බදු ලබාදී ඇති රජයේ ඉඩම් සහ එම ඉඩම්වල පිහිටි ගොඩනැගිලි අතුරු බදුදීම සඳහා නිරන්තරයෙන් ඉල්ලීම් ඉදිරිපත් වේ. එසේ අතුරු බදු ලබා දීමේදී ඉදිරිපත් කරන අතුරු බදු ගිවිසුම් පරීක්ෂා කිරීමේදී රජයේ ඉඩම් උපයෝගී කර ගනිමින් අතුරු බදු ගිවිසුම් මඟින් බදුකාර පාර්ශවයන් විශාල මුදලක් උපයන බවත් එමඟින් රජයට හිමිවිය යුතු ආදායමක් අහිමිවන බවත් නිරීක්ෂණය වේ.

02. ඒ අනුව රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන අනුව දීර්ඝ කාලීන බදු ලබාදී ඇති රජයේ ඉඩම් අතුරු බදු දීම සඳහා ඉඩ ලබාදිය හැකි බවට අදාල බදු ගිවිසුමේ ඉඩ ප්‍රස්ථාව සලසා ඇති සෑම අවස්ථාවකදීම කොන්දේසි ප්‍රකාරව අතුරු බදු ලබා දීම සිදුකිරීමේදී බදුකාර පාර්ශවයන් විසින් අතුරු බදු ගිවිසුම්කරු සමඟ එළඹෙන අතුරුබදු ගිවිසුමෙහි එළඹෙන බදු කොන්දේසි වලට අනුව අදාල අතුරු බදු මුදලින් 10% ක මුදලක් භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු බවට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙතින් තීරණය කර අංක PFD/LAND/122/000/GN/01 හා 2019.05.23 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

03. ඒ අනුව මින් ඉදිරියට අතුරුබදු ලබා දීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන සෑම අතුරු බදු ගිවිසුම් කෙටුම්පතකම එම කොන්දේසිය ඇතුලත් කිරීමට හා බදුකාර පාර්ශවයන් අදාල අතුරු බදු දීම් වලට එළැඹීමෙන් අනතුරුව ලියාපදිංචි කරන අතුරු බදු ගිවිසුමේ පිටපතක් අදාල බදුකරු වෙනුවෙන් පවත්වා ගෙනයන බදු ගොනුවට ඇතුලත් කලයුතු අතර මෙම මුදල් අයකිරීම ඒ අනුව අධීක්ෂණය කලයුතුය. එම ලියාපදිංචි කරන ලද ගිවිසුමෙහි පිටපත් ප්‍රාදේශීය ලේකම් විසින් පළාත් ඉඩම් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) වෙත පිටපත් සහිතව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

04. අතුරු බදු මුදලින් ප්‍රතිශතයක් ලෙස අය කරන මෙම මුදල අයකරනුයේ බදුකරයේ සඳහන් වාර්ෂික බදු මුදලට අමතර මුදලක් ලෙස විය යුතුය. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් අනුමැතිය මත 2019.05.23 දිනෙන් පසුව එළඹෙන සියළු අතුරු බදු ගිවිසුම් සඳහා අදාල විය යුතු බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

05. මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් අවශ්‍යනම් මා විමසන ලෙස වැඩිදුරටත් දන්වමි.

ආර්.එම්.සී.එම්.හේරත්,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්:

01. ජනාධිපති ලේකම් - ජනාධිපති කාර්යාලය - කරු. දැ.ගැ.පි

02. ලේකම් - ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය - කරු. දැ.ගැ.පි

03. අධ්‍යක්ෂ ජනරාල් - මුදල් දෙපාර්තමේන්තුව - ඔබගේ අංක PFD/LAND/122/000/GN/01 හා 2019.05.23 දිනැති ලිපිය අනුව කරු. දැ.ගැ.පි

04. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.පි